# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/19 - 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2024.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 01.
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2024 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි, සංශෝධිත, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අනිවාර්ය අංගයක් ලෙස නිකුත් කෙරේ.

3. ඉහත සඳහන් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 4 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ ආනයනය සඳහා, අදාළ විෂය භාර අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය මත, එච්. එස්. 87 පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කරන ලද මෝටර් වාහන ආනයනය කිරීමේදී අදාළ වන අනෙකුත් පවතින නීතිරීති සහ රෙගුලාසිවලට යටත්ව ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර ලබා දෙනු ලැබේ.


1A - PG 6618 — 406 (2024/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| එච්. එස්. කේතය | විස්තරය | ඒකක ගණන | ආනයනකරු / භාණ්ඩ තොග ලබන්නා |
|---|---|---|---|
| 8702.10.75 | පිරිමැසුම් පන්තියේ රැම්ප් රථ | 03 | ශ්‍රීලංකන් ගුවන් සමාගම |
| 8702.10.75 | බස් රථ | 01 | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 8702.10.55 | බස් රථ | 01 | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 8704.22.61 | ජංගම මාතෘ ඒකක | 03 | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 8704.21.91 | ඩබල් කැබ් රථ | 21 | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 8703.32.79 | එස්යූවී | 01 | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය |

4. වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 නොවැම්බර් මස 28 දිනැති අංක 23/2288/628/105/TBR දරන සංදේශය පිළිබඳ 2023 දෙසැම්බර් මස 06 දිනැති, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමග එක්ව කියවනු ලබන එකී සංදේශය සඳහා ලද 2023 දෙසැම්බර් මස 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, වාණිජ බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත **"මෙහෙයුම් උපදෙස්"** නිකුත් කරනු ලැබිය යුතුය.

6. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 01 - 0102

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.